**මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතිය - 2016**

---

මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ආසියානු සංවර්ධන බැංකුව අතර 2009 දෙසැම්බර් 18 දින එළඹි අංක 2557 /2558 එස්ආර්අයි දරන ණය ගිවිසුම්වල II වාවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

මහ කොළඹ අප ජලය කළමනාකරණ ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වේ. මහනගර සභා ප්‍රදේශය ඇතුළත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කොළඹ මහ නගර සභාව වගකීම දරන අතර කොලොන්නාව නගර සභාව හා දෙහිවල ගල්කිස්ස මහනගර සභා ප්‍රදේශ ඇතුළත කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වගකීම දරනු ලැබේ. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන කාර්යයන් පිළිබඳ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ. අප ජලය කළමනාකරණ සේවා මඟින් මහ කොළඹ ප්‍රදේශයේ නාගරික හා උප නාගරික නිවැසියන් සඳහා නාගරික පරිසරය හා මහජන සෞඛ්‍ය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ප්‍රදේශය ඇතුළත නිවැසියන් 645,000 ක් සඳහා අප ජලය කළමනාකරණ සේවා වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිඵලය වේ. ණය ගිවිසුම් අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,410 කට සමාන එජඩො මිලියන 116.60 ක් වන අතර, ඉන් රු.මිලියන 9,200.80 කට සමාන එජඩො මිලියන 80 ක් හෙවත් සියයට 68.6 ක් ආසියානු සංවර්ධන බැංකුවේ සාමාන්‍ය ප්‍රාග්ධන සම්පත් මඟින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබූ අතර රු.මිලියන 2,300.20 කට සමාන එජඩො මිලියන 20 ක් හෙවත් සියයට 17.1 ක් ආසියානු සංවර්ධන බැංකුවේ විශේෂ අරමුදල් සම්පත් මඟින් මූල්‍යායනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 1,909 කට සමාන එජඩො මිලියන 16.60 ක් හෙවත් සියයට 14.3 ක් ශ්‍රී ලංකා රජය මඟින් දායක වීම සඳහා සැලසුම් කර තිබුණි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැයෙන් රු.මිලියන 1,731.70 කට සමාන එජඩො මිලියන 12.60 ක මුදලක් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් සඳහා වෙන්කර තිබුණි. තවද, ප්‍රදානයක් ලෙස සියයට 82.5 ක් හා ණය මුදලක් ලෙස සියයට 17.5 ක මිශ්‍රණයකින් සමන්විත වූ රු.මිලියන 647.68 කට සමාන විගැහි මිලියන 3.6 ක් (එජඩො මිලියන 5.64 ක්) සැපයීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය අතර 2010 ජුලි 02 දින අතිරේක මූල්‍යායන ගිවිසුමක් අත්සන් කරන ලදී. රු.මිලියන 364.35 කට සමාන ඉතිරි මුදල වන එජඩො මිලියන 3.17 ක මුදල මූල්‍යායනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය එකඟ වී තිබුණි. 2009 දෙසැම්බර් 18 දින ව්‍යාපෘතිය එහි කටයුතු ආරම්භ කරන ලද අතර, 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. පසුව, ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2017 මාර්තු 30 දක්වා දීර්ඝ කරන ලදී.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4. විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේ ද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක

කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි· කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම් ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල, ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේ ද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග සතුටුදායක ලෙස සසඳා තිබුණේද බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේ ද යන බව.

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකිද යන බව.

(ඉ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඊ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුම්වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේ ද යන බව.

(උ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේ ද යන බව.

(ඌ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේ ද යන බව.

(එ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේ ද යන බව.

(ඡ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේ ද යන බව, සහ

(ඹ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වුයේ ද යන බව.

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-----------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගතවන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌන පූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණු බව සහ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුම්වල දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුම්වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ව්‍යාපෘතිය විසින් 2016 දෙසැම්බර් 31 දක්වා ගෙවන ලද එකතුව රු.මිලියන 62.13 ක් වූ එකතු කළ අගය මත බදු කෙරීගෙන යන වැඩ යටතේ දක්වනු වෙනුවට ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයට එරෙහිව නිරවුල් කර තිබුණි.

(ආ) ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව, 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ක්‍රියාත්මක කරන ලද කාර්යයන් පිළිබඳ කෙරීගෙන යන වැඩ රු.මිලියන 763.62 ක් විය. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන අනුව, එය රු.මිලියන 754.56 ක් ලෙස දක්වා තිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම**

2005 අංක 05 දරන මුදල් පනතේ III කොටසේ අවශ්‍ය පරිදි 2016 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන ලද එකතුව රු.මිලියන 666.29 ක් වූ ගෙවීම් මත ඉදිකිරීම් කර්මාන්ත සහතික අරමුදල් බදු ව්‍යාපෘතිය විසින් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම් අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ආසබැ | 9.43 | 1,367.35 | 484 | 2.31 | 336.02 | 4.87 | 684.55 |
| ශ්‍රීලංර | 3.17 | 364.35 | 150 | 0.53 | 77.32 | 1.05 | 148.32 |
| එකතුව | **12.60** | **1,731.70** | **634** | **2.84** | **413.34** | **5.92** | **832.87** |

ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු කරගැනීම සඳහා විස්තරාත්මක සැලැස්මක් පිළියෙල කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘති කාලපරිච්ඡේදය ඇතුළත කාර්යයන් සම්පූර්ණ කර ගැනීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් ව්‍යාපෘතිය විසින් ස්ථාපිත කර නොතිබූ බව නිරීක්ෂණය විය. ව්‍යාපෘතියේ කාර්යයන් ආරම්භ කර වර්ෂ 06 ක් ඉකුත්වීමෙන් පසු 2016 දෙසැම්බර් 31 දිනට එජඩො මිලියන 12.60 ක් වූ මුළු වෙන්කිරීමෙන් සියයට 47 ක් නියෝජනය වන එජඩො මිලියන 5.92 ක් පමණක් උපයෝජනය කර තිබූ බව තවදුරටත් තහවුරු විය. තවද, 2016 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද රු.මිලියන 634 ක් වූ වෙන්කිරීමෙන් සියයට 65 ක් නියෝජනය වන රු.මිලියන 413.34 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

----------------------

ව්‍යාපෘතිය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 89 ක් හා සියයට 60.5 ක්ව පැවතුණි. දෙහිවල, ගල්කිස්ස සහ කොලොන්නාව නගර සභා ප්‍රදේශවල අප ජලය පොම්ප කිරීමේ මධ්‍යස්ථාන 06 ක් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා කොන්ත්‍රාත්තු පිරිනැමීමේ ප්‍රමාදයන් හේතුවෙන් ව්‍යාපෘති කාල පරිච්ඡේදය 2017 මාර්තු 30 දක්වා දීර්ඝ කර තිබුණි. තවද, ආනයනය කරන ලද ගිල්විය හැකි (submersible) පොම්ප සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමඟ වූ නොඑකඟතාවයන් හේතුවෙන් කොන්ත්‍රාත් කාලපරිච්ඡේදය 2017 ජුනි 30 දක්වා තවදුරටත් දීර්ඝ කර තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1,028 කට සමාන එජඩො මිලියන 7.79 කට සිවිල් වැඩ සඳහා කොන්ත්‍රාත්තුවක් 2014 ජුලි 15 දින ප්‍රදානය කර තිබුණද රු.මිලියන 739 කට සමාන එජඩො මිලියන 5.63 ක් පමණක් අදාළ කොන්ත්‍රාත්තුව සඳහා වෙන්කර තිබුණි. රු.මිලියන 289 කට සමාන එජඩො මිලියන 3.75 ක ඉතිරි මුදල කොළඹ මහ නගර සභාව විසින් වෙන්කරන ලදී.

(ආ) වැඩ පිළිබඳ සැලසුම් හා ඒ සඳහා ප්‍රමාණ පත්‍ර ව්‍යාපෘතිය විසින් විධිමත් ලෙස පිළියෙල කර නොතිබූ බව නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් ලෙස, රු.මිලියන 111.45 කට සමාන එජඩො 774,918 ක පිරිවැයට විචලන නියෝගයන් 33 ක් කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබූ අතර 2016 දෙසැම්බර් 31 වන විට ඉන් විචලන නියෝග 10 ක් සඳහා රු.මිලියන 65.99 කට සමාන එජඩො 458,886 ක මුදල් ඉල්ලීම් ව්‍යාපෘතිය විසින් නිරවුල් කර තිබුණි.

(ඇ) පවත්නා සම්ප්‍රේෂණයන් මගින් පුළුල් වැදගත්කමක් සහිතව නාගරික පරිසරය හා මහජන සෞඛ්‍යය වැඩිදියුණු කිරීම සහ මලාපවහනය හා අපජලය ක්‍රමානුකූලව අපහරණය කිරීම සඳහා ව්‍යාපෘතියේ කාර්යයන් සකස් කර තිබුණි. කෙසේ වුවද, පිරිසිදු කිරීමෙන් තොරව පොම්ප කිරීමේ මධ්‍යස්ථානයේ ක්‍රියාවලියෙන් මඩ සහිත අපද්‍රව්‍ය පිටකිරීම වැඩි වී තිබීම හා ගල් හා වැලි පොම්පාගාර අංගණය ඇතුළට විදීම 2017 ජුලි 13 දින සිදුකරන ලද විගණන ක්ෂේත්‍ර පරීක්ෂණයේදී නිරීක්ෂණය විය. එබැවින්, පරිසර දූෂණ අවදානම හා ඒ අනුව සේවක සෞඛ්‍යයට වන බලපෑම පිළිබඳ අවදානම විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 3.4 මූල්‍ය පාලන පිළිබඳ කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 134(3) හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට භාජනය කර නොතිබුණි.

(ආ) ගස් 35 ක් කපා දැමීම හා ව්‍යාපෘතිය විසින් එකතුකර ගන්නා ලද ආදායම පිළිබඳ තොරතුරු සම්බන්ධයෙන් ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.